**ජාතික සමුපකාර සංවර්ධන ආයතනය - 2014**

**-----------------------------------------------------**

ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය හා 2001 අංක 1 දරන ජාතික සමුපකාර සංවර්ධන ආයතනය (සංස්ථාගත කිරීමේ) පනතේ 22 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**---------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

-----------------------------------------

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16**

-----------------------------------

2014 නොවැම්බර් 13 වන දින භාවිතයට ගත හැකි තත්ත්වයට පත් කර තිබුණු ශ්‍රවණාගාරයේ පිරිවැය රු.359,116,705 ක් වුවද පිරිවැය වශයෙන් ගිණුම්ගත කර තිබුණේ රු.272,659,213 ක් පමණි. ඒ අනුව පිරිවැය වශයෙන් හඳුනා නොගත් රු.86,457,492 ක් වූ මුදල, පිරිවැය ඇස්තමේන්තු පරීක්ෂණ කමිටුවේ නිර්දේශය හා ස්ථාවර තාක්ෂණික කමිටුවේ අනුමැතිය ප්‍රමාද වීම මත 2016 ජුනි 10 වන විටත් ගෙවා නොතිබුණ අතර ඒ සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 අනුව මූල්‍ය ප්‍රකාශනවල වෙන්කිරීමක් කර නොතිබුණි. තවද මුළු පිරිවැය සඳහා ක්ෂය ගිණුම්ගත කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

ආයතනයේ නිවාඩු නිකේතනය භාවිතා කිරීම වෙනුවෙන් අයවිය යුතු රු.48,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

#### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

එකතුව රු.4,575,270 ක් වූ ණයගැති ශේෂ සහ එකතුව රු.8,595,615 ක් වූ ණයහිමි ශේෂවලට අදාළව ශේෂ තහවුරු කිරීමේ ලිපි විගණනය වෙත ඉදිරිපත් නොකෙරුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) එකතුව රු.1,718,377 ක් වූ ලැබිය යුතු පාඨමාලා ගාස්තුවලින් වර්ෂය ඉක්ම වූ රු.665,131 ක් හා වර්ෂ 5 ඉක්ම වූ රු.89,122 ක්විය.

(ආ) එකතුව රු.1,734,833 ක් වූ බාහිර පුහුණු වැඩසටහන්වලින් ලැබිය යුතු රු.248,468 ක් වර්ෂ 5 ට වඩා පැරණි ශේෂ වූ අතර එකතුව රු.11,776 ක් වූ ලැබිය යුතු මුද්‍රණ ගාස්තු වර්ෂ 3 ක් ඉක්ම වූ ශේෂ විය.

(ඇ) කලින් ලැබූ ආදායම්වලින් එකතුව රු.26,121,790 ක් වර්ෂ 1 සිට වර්ෂ 5 දක්වා කාලයක සිටද රු.79,615 ක් වර්ෂ 5 කට වැඩිකාලයක සිටද නිරවුල් කර නොතිබුණි.

**2.4 නීතිරීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීතිරීති යනාදියට යොමුව** | | **අනුකූල නොවීම** |
|---|---|---|
| (අ) | 1999 පෙබරවාරි 26 දිනැති අංක 02/99 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | ජංගම දුරකථන සැපයීම කැබිනට් අමාත්‍යාංශ ලේකම්වරුන්ට පමණක් සීමාකර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ ජනරාල්වරයාට රු.28,000 ක් වැය කර ජංගම දුරකථනයක් මිලදී ගෙන තිබුණි. |
| (ආ) | 1999 ඔක්තෝබර් 08 දිනැති අංක 22/99දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2001 පෙබරවාරි 28 දිනැති අංක පීඑෆ්/පීඊ 14දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වෙන් කළ වාහනයක් භාවිතා කරනු ලබන සභාපතිවරයාට චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව සමාලෝචිත වර්ෂයේදී සංචිත වාහන භාවිතා කිරීම වෙනුවෙන් කිලෝමීටර් 12,833 ක් සඳහා රු.192,939 ක ඉන්ධන වියදමක් දරා තිබුණි. |
| (ඇ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඞී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.3 වගන්තිය | මුදල් අමාත්‍යවරයාගේ හා විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව රු.6,290,515 ක් ආයෝජනය කර තිබුණි. |
| (ඈ) | 2006 ජනවාරි 25 දිනැති ප්‍රසම්පාදන මාර්ගෝපදේශය | |
| | (i) 1.2.1(සී) වගන්තිය | ප්‍රසම්පාදනයේදී සැපයුම්කරුවන්ට සමාන අවස්ථා හිමිවිය යුතු වුවද ඊට පටහැනිව සමුපකාර සමිති පරිගණකගත කිරීමේ ජාතික වැඩසටහන සඳහා පෞද්ගලික ආයතනයක් සමඟ 2013 නොවැම්බර් 15 දින අවබෝධතා ගිවිසුමකට එළඹ තිබුණ ද ඒ සඳහා වූ ප්‍රසම්පාදන තීරණය 2014 අප්‍රේල් 09 දින ලැබී තිබුණි. |
| | (ii) 3.6 වගන්තිය | ආයතනයේ සියලු ගොඩනැගිලි පවිත්‍රතා කටයුතු සහ උද්‍යාන අලංකරණ කටයුතු පිළිබඳ කොන්ත්‍රාත්තුව 2011 වර්ෂයේදී රාජ්‍ය සංස්ථාවකට අනුබද්ධිත පුද්ගලික සමාගමකට ප්‍රදානය කර තිබුණ අතර 2012, 2013 හා 2014 වර්ෂ සඳහා ලංසු කැඳවීමකින් තොරව එම සමාගම සමඟ කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කර ගිවිසුම්ගතව තිබුණි. |
| (ඉ) | 2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | සෑම මුදල් වර්ෂයකම දෙසැම්බර් 15 දිනට පෙර එම වර්ෂය සඳහා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල පත් කර ඊළඟ වර්ෂයේ ජනවාරි 29 දිනට පෙර වාර්තා සැපයීම කළයුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

**3. මූල්‍ය සමාලෝචනය**

**3.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.5,786,121 ක ඌනතාවයක් වූ අතර ඊට

අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.706,772 ක් විය. ඒ අනුව ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.5,079,349 ක පිරිහීමක් නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වියදම් රු.7,865,518 කින් වැඩිවී තිබීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනය විසින් පවත්වන ලද පාඨමාලාවල ප්‍රගතිය ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| පාඨමාලාව | 2014 ඉලක්කගත පාඨමාලා සංඛ්‍යාව | 2014 ඉලක්කගත පුහුණුලාභීන් ගණන | 2014 තථ්‍ය පාඨමාලා සංඛ්‍යාව | 2014 තථ්‍ය පුහුණුලාභීන් ගණන | 2013 තථ්‍ය පාඨමාලා සංඛ්‍යාව | 2013 තථ්‍ය පුහුණුලාභීන් ගණන | ඉලක්ක ඉටු කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස(පුහුණු ලාභීන් අනුව) |
|---|---|---|---|---|---|---|---|
| නිත්‍ය පුහුණු පාඨමාලා | 06 | 249 | 03 | 143 | 04 | 161 | 57 |
| ඩිප්ලෝමා පාඨමාලා | 17 | 300 | 09 | 178 | 08 | 162 | 59 |
| සහතිකපත්‍ර පාඨමාලා | 15 | 350 | 11 | 169 | 08 | 241 | 48 |
| කෙටිකාලීන කළමනාකරණ සංවර්ධන පාඨමාලා | 31 | 625 | 16 | 435 | 22 | 577 | 70 |
| බාහිර ආයතනවල ඉල්ලීම මත පැවති පාඨමාලා | - | - | 07 | 360 | 17 | 558 | - |
| මහජන බැංකු ආධාර යටතේ පවත්වන ලද පාඨමාලා | - | - | 10 | 359 | 04 | 155 | - |
| බාහිර උපාධි හා වෘත්තීය උපකාරක වැඩසටහන් | 14 | 350 | 11 | 187 | 10 | 188 | 53 |
| | 83 | 1874 | 67 | 1831 | 73 | 2042 | |

(i) සමාලෝචිත වර්ෂයේදී පුහුණුලාභීන් 1174 දෙනෙකුගේ සහභාගිත්වයෙන් නිත්‍ය පුහුණු පාඨමාලා, ඩිප්ලෝමා පාඨමාලා හා කෙටිකාලීන කළමනාකරණ සංවර්ධන පාඨමාලා 54 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද පුහුණුලාභීන් 756 දෙනෙකුගේ සහභාගිත්වයෙන් පාඨමාලා 28 ක් පමණක් පවත්වා තිබුණි. එනම් ඉලක්කගත පාඨමාලාවලින් සියයට 48 කි. ඉකුත් වර්ෂයේදීද එම පාඨමාලා 34 ක් පවත්වා තිබු

අතර සමාලෝචිත වර්ෂයේදී එම පාඨමාලා පැවැත්වීම දුර්වල මට්ටමක පවතින බව නිරීක්ෂණය විය.

(ii) අධ්‍යයන හා පුහුණු කටයුතු ඉටුකිරීම හා ඊට අදාළ පහසුකම් සැපයීම ආයතනයේ ප්‍රමුඛතම කාර්යය වුවද ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පරිගණක විද්‍යාගාරයට ජාලකරණ පහසුකම් සපයා නොමැතිවීම මත පරිගණක පාඨමාලා සාර්ථකව පැවැත්වීම ගැටළු සහගත වී තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුළ ආයතනය විසින් පැවැත්වූ පාඨමාලාවලින් ලද ආදායම් ඉකුත් වර්ෂය සමඟ සසඳා පහත දැක්වේ.

| පාඨමාලාව | 2014 වර්ෂය | | 2013 වර්ෂය | ඉලක්ක ඉටු කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඉලක්කගත | තථ්‍ය | තථ්‍ය | |
| | රු. | රු. | රු. | |
| නිත්‍ය පුහුණු පාඨමාලා | 2,149,472 | 1,642,735 | 1,499,233 | 76 |
| ඩිප්ලෝමා පාඨමාලා | 5,829,500 | 3,807,500 | 3,600,800 | 65 |
| සහතිකපත්‍ර පාඨමාලා | 5,370,500 | 1,278,800 | 2,283,676 | 24 |
| කෙටිකාලීන කළමනාකරණ සංවර්ධන පාඨමාලා | 9,786,500 | 7,209,629 | 4,836,581 | 74 |
| ගිණුම්කරණ වෘත්තීය පාඨමාලා උපකාරක වැඩසටහන් | 6,372,000 | 1,747,597 | 1,828,470 | 27 |
| බාහිර උපාධි පාඨමාලා | 4,760,000 | 448,750 | 916,200 | 09 |
| එකතුව | 34,267,972 | 16,135,011 | 14,964,960 | |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය සමුපකාර සහතික පත්‍ර පාඨමාලාව පැවැත්වීම වෙනුවට පරිගණක ක්ෂේත්‍රය ඇතුළු වෙනත් ක්ෂේත්‍රවල නව පාඨමාලා ආරම්භ කිරීම හේතු කොට ගෙන ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේ පැවැත්වීමට අපේක්ෂා කළ සහතිකපත්‍ර පාඨමාලාවලින් අපේක්ෂිත ආදායම රු.4,091,700 කින් එනම් සියයට 76 කින් අඩු වී තිබුණි.

(ii) පාඨමාලා ගාස්තු වැඩිකිරීම හේතුවෙන් ගිණුම්කරණය පිළිබඳ වෘත්තීය පාඨමාලා සඳහා උපකාරක වැඩසටහන් හා බාහිර උපාධි පාඨමාලාවලින් ඉලක්කගත ආදායමට සාපේක්ෂව තථ්‍ය ආදායමේ සියයට 80 ක එනම් රු.8,935,653 ක අඩුවීමක් නිරීක්ෂණය විය.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2001 අගෝස්තු මාසයේදී රු.මිලියන 44.5 ක පිරිවැය ඇස්තමේන්තුවක් මත ඉදිකිරීම් ආරම්භ කළ ආයතනයේ ශ්‍රවණාගාරය 2003 අප්‍රේල් මාසයේ අවසන් විය යුතුව තිබුණද එය 2005 පෙබරවාරි 14 දින වන විටත් අවසන් කර නොතිබුණ අතර ශ්‍රවණාගාරයේ වහලය කඩාවැටීම හේතුවෙන් ඉදිකිරීම් කටයුතු අතරමඟ නතර වී තිබුණි. කෙසේ වුවද වහලයේ සම්පූර්ණ ඉදිකිරීම්ද ඇතුළත්ව ඉතිරි වැඩ නිම කිරීම සඳහා රු.මිලියන 113 ක් වූ නව පිරිවැය ඇස්තමේන්තුවකට ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයට 2009 වර්ෂයේදී පවරා තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.

(i) ශ්‍රවණාගාරය ඉදිකිරීම් සැලසුම්වලට වරින් වර කරන ලද සංශෝධන නිසා ඉදිකිරීම් 2012 මැයි මාසය වන විට නතර වී තිබුණු අතර නැවත 2012 දෙසැම්බර් මාසයේ ආරම්භ කර 2013 මාර්තු 31 අවසන් කිරීමට මධ්‍යම උපදේශක කාර්යාංශය සමඟ ගිවිසුම්වලට එළඹ තිබුණි. එසේ අදාළ දින ශ්‍රවණාගාරය විවෘත කිරීමට නියමිතව තිබියදී එවකට විෂය භාර අමාත්‍යවරයා, රේඛීය අමාත්‍යාංශයේ ලේකම් සහ ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් 2013 ජුනි 06 දින කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂාවේදී පහත වෙනස්කම් කිරීමට උපදෙස් දී තිබුණි. මෙම වෙනස්කම් කළ අයිතම සඳහා ආයතනය විසින් පෙර හා පසු දරන ලද වියදම පිළිවෙලින් රු.9,200,392 ක් හා රු.14,141,823 ක් වූයෙන් පෙර දරන ලද වියදම ඵලදායි නොවන වියදමක් ලෙස නිරීක්ෂණය විය.

- ඇලුමිනියම් ජනේල හා දොරවල් ගලවා පදම් කළ වීදුරු සවිකිරීම හා ඊට සරිලන තිර රෙදි නැවත දැමීම.
- ඇතුළත හා පිටත තීන්ත ආලේප කිරීම සම්පූර්ණයෙන් වෙනස් කිරීම.
- වැසිකිලි පද්ධතියේ ටයිල් හා සනීපාරක්ෂක උපකරණ ගලවා වෙනත් සුඛෝපභෝගී උපකරණ සවිකිරීම.

(ii) ඉහත වෙනස් කිරීම් නිසා ඉවත් කළ භාණ්ඩ පැරණි කාර්යාල ගොඩනැගිල්ලක නිෂ්ක්‍රීයව රඳවා තබා ඇති අතර මුළු පිරිවැයෙහි කොටසක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(iii) ශ්‍රවණාගාරයෙන් ඉවත් කරන ලද පිරිවැය රු.4,107,280 ක් වූ භාණ්ඩ අපහරණය කිරීමේදී ස්වාධීන තක්සේරුකරුවකුගේ වාර්තාවක් වෙනුවට බිල්පත් සහතික කරන ඉංජිනේරුවරයාගෙන් අදාළ වාර්තාව ලබා ගෙන තිබුණි. ඒ අනුව භාණ්ඩ විකිණීමෙන් ලද මුදල රු.1,486,745 ක් වූ බැවින් සිදු වූ පාඩුව රු.2,620,535 ක් විය. විකුණුම් මුදල ප්‍රාග්ධන නොනිමි ගිණුමට බැර කිරීම හැර පිරිවැය හා එයින් වූ අලාභය ගිණුම්වලට ගළපා නොතිබුණි. තවද මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 102, 103 හා 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(iv) ස්වාභාවික ගල් පලුවක් උපයෝගී කරගෙන කපා පොලිෂ් කර නිර්මාණය කරන ලද සමරු පලකය සඳහා රු.500,000 ක් ඇස්තමේන්තු කර තිබුණද රු.2,128,195 ක් වැය කර තිබුණි.

(v) 2014 නොවැම්බර් 13 වන දින අවසන් කර තිබූ මෙම ශ්‍රවණාගාරය සඳහා දරන ලද වියදම 2014 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 369.1 ක් විය. ඉන් රු.මිලියන 86.4 ක් සඳහා 2013 නොවැම්බර් 12 දිනැති අංක 012/540/1480/13 දරන අමාත්‍ය මණ්ඩල

තීරණය අනුව පිරිවැය ඇස්තමේන්තු පරීක්ෂණ කමිටුවේ නිර්දේශ ලබාගැනීමට අවශ්‍යවන අමාත්‍ය මණ්ඩල ප්‍රසම්පාදන කමිටුවක් 2015 අගෝස්තු 05 දින වන විටත් පත් කර නොතිබුණි.

(vi) ශ්‍රවණාගාරය 2014 නොවැම්බර් මාසයේ විවෘත කිරීමෙන් පසු එහි ආසන අතර පොළවේ ඇති වූ වේයන් මර්ධනයට මධ්‍යම ඉංජිනේරුමය කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශයේ හා පත්කර තිබූ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විශේෂඥ දැනුමැති නිලධාරියාගේ කිසිදු මැදිහත්වීමකින් තොරව හා 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.2 ඡේදයේ සඳහන් කරුණුවලට පටහැනිව ගිවිසුමකින් තොරව පුද්ගලික සමාගමකට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර රු.420,895 ක් ගෙවා තිබුණද 2015 අගෝස්තු 10 දින වන විටත් ශ්‍රවණාගාර භූමියේ බුමුතුරුණු අතර වේයන්ගේ ගැවසීම දක්නට ලැබුණි. ශ්‍රවණාගාරයේ අත්තිවාරම දැමීමේදී නිසි ප්‍රමිතියකින් තොරව වේයන් මර්ධන නාශක දියර යොදා නොතිබීම හේතුවෙන් මෙම තත්ත්වය උදා වී ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.

(vii) සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ශ්‍රවණාගාරයෙන් අපේක්ෂිත ආදායම රු.6,500,000 ක් වුවත් 2014 දෙසැම්බර් 31 දින වනවිට උපයාගත හැකිව තිබුණේ රු.175,000 ක් පමණි. මෙය අපේක්ෂිත ආදායමෙන් සියයට 2.6 ක් විය. අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියකින් හා මුදල් අය කිරීමකින් තොරව සමෘද්ධිලාභීන්ගේ වැඩමුළුවක් හා පෙර පාසල් උත්සවයක් පැවැත්වීමට අවස්ථා තුනකදී සහන මිල ගණන් යටතේ ඉඩ පහසුකම් සැපයීම නිසා අහිමි වූ ආදායම රු.1,163,500 ක් විය.

(ආ) සමාලෝචිත වර්ෂය තුළදී සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රු.7,640,378 ක් වැය කර නවීකරණය කරන ලද ආයතනයේ ගොඩනැගිල්ලක් නිසියාකාරව පවරාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

--------------------------------

**උපදේශක සේවාව**

---------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතනයේ පරිගණක අංශය දැනට පවත්නා තත්ත්වයට වඩා ඉහළ මට්ටමකට ගෙන ඒම සඳහා පරිගණක උපදේශකවරයකු 2012 ජනවාරි 01 දින වසරක කාලයකට පත් කර තිබුණි. 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.8.2 වගන්තිය අනුව භාණ්ඩාගාර අනුමැතිය නොමැතිව හා උපදේශන සේවා මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6 මාර්ගෝපදේශය අනුව විධිමත් පරිදි යෝජනා කැඳවීමකින් තොරව මෙම බඳවා ගැනීම සිදු කර තිබුණි.

(ආ) මුදල් රෙගුලාසි 71 අනුව භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව උපදේශන දීමනා වශයෙන් මාසයකට රු.30,000 බැගින් 2012, 2013 හා 2014 වර්ෂ සඳහා ගෙවා තිබූ උපදේශක ගාස්තුව රු.1,080,000 ක් විය. එයින් රු.720,000 ක් ගිවිසුමකින් තොරව ගෙවා තිබුණි. එසේම සේවය නොකළ පැය 269 ක් සඳහා රු.50,433 ක් ගෙවා තිබුණ අතර උපදේශන සේවා සැපයූ කාලය තුළ විධිමත් අධිකාරියකින් තොරව ආයතනයේ පාඨමාලාවෙන් 4 ක දේශන පැවත්වීම වෙනුවෙන් දේශන ගාස්තු රු.52,400 ක් ද ගෙවීම් කර තිබුණි.

(ඇ) වසර 3 ක උපදේශක සේවා සැපයීම් කළ කාලය තුළ පරිගණක දෘඩාංග පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හඳුන්වා දීම හා පැවති පරිගණක දෘඩාංග පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාවේ විෂය නිර්දේශය සංශෝධනය කිරීම පමණක් සිදු කර තිබුණ අතර ගිවිසුම පරිදි ඉදිරිපත් කළ යුතු ව්‍යාපෘති වාර්තාව ඉදිරිපත් කර නොතිබුණි. තවද 2014 දෙසැම්බර් 31 දින උපදේශක

පත්වීම අවසන් කර නිසි පරිදි බඳවා ගැනීමකින් තොරව 2015 වර්ෂයේදී බාහිර කථිකාචාර්යවරයෙකු ලෙස පත්කර තිබුණි.

(ඇ) 2009 වර්ෂයේ සිට ආයතනයේ පරිගණක වැඩසටහන් නිලධාරියකු වශයෙන් පත්වීම් ලැබූ නිලධාරියා පසුගිය වසර 05 සඳහා ආයතනයට හඳුන්වා දී තිබුණේ ආයතනයේ දේශකවරුන්ගේ මාසික කාලසටහන් ක්‍රමය සඳහා වන පරිගණක වැඩසටහන පමණි. මෙම වැඩසටහනද ආයතනයේ කටයුතු සඳහා උපයෝගී කර ගත් බවට සාධක නොවීය. ආයතනයේ ස්ථිර වැටුපක් ලබන මෙම පරිගණක වැඩසටහන්කරු සිටියදී 2012-2014 කාලපරිච්ඡේදය තුළදී ඉහත පරිදි පරිගණක උපදේශකයකු බඳවා ගෙන රු.1,080,000 ක උපදේශක ගාස්තු ගෙවා තිබුණි. තවද පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය සමඟ එකඟව ඖෂධ නිෂ්පාදන මිල ඇගයීම් පරිගණක වැඩසටහන නිර්මාණය සඳහා පෞද්ගලික ආයතනයකට පැවරීම නිසා ආයතනයට අහිමි වූ ආදායම රු.1,975,000 ක් වූයෙන් ආයතනයට සිදුවූ මුළු පාඩුව රු.3,055,000 ක් විය.

## 4.4 නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2009, 2010 හා 2013 වර්ෂයන්හිදී මිලදී ගත් ශ්‍රවණාගාර පද්ධතියක්, ෂීට් රෝල් 54 ක් සහ ජංගම දුරකථන 02 ක් ගබඩාවේ නිෂ්ක්‍රීයව පැවති අතර මෙහි වටිනාකම් ලේඛනගතවී නොතිබුණි.

(ආ) ආයතන ශ්‍රව්‍ය දෘශ්‍ය අංශය සතුව මල්ටිමීඩියා, ශබ්ද විකාශන උපකරණ හා ලැප්ටොප් පරිගණක භාවිතයට ගත හැකිව තිබියදී, ප්‍රසම්පාදන ක්‍රියාවලියකින් තොරව බාහිර පාර්ශවයන්ගෙන් එම උපකරණ කුලී පදනම මත ලබා ගෙන සමාලෝචිත වර්ෂය තුළදී රු.29,400 ක කුලී ගෙවා තිබුණි.

## 4.5 හඳුනා ගන්නා ලද පාඩු

-------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංවර්ධන ආයතනය සහ ඉන්දියාවේ අන්තර්ජාතික සහයෝගිතා හා කෘෂිකාර්මික බැංකු පුහුණුවීම් මධ්‍යස්ථානය ඒකාබද්ධව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් මාසයේදී පවත්වන ලද වැඩසටහනට සහභාගී වූ ප්‍රතිලාභීන් 37 දෙනාගෙන් නවාතැන් ගාස්තු ලෙස අයවිය යුතු රු.246,000 ක මුදලින් අය කර ගෙන තිබුණේ රු.184,500ක මුදලක් බැවින් ආයතනයට වූ පාඩුව රු.61,500ක් විය.

(ආ) ණය දෙන සමුපකාර සමිති අත්දැකීම් හුවමාරු කර ගැනීමේ වැඩසටහන සඳහා තායිලන්තයේ ආසියානු සමුපකාර ණය ගනුදෙනු පිළිබඳ සම්මේලනයට 2014 අගෝස්තු 28 දින නිකුත් කළ ඇමෙරිකානු ඩොලර් 3,000ක බැංකු අණකරය 2014 සැප්තැම්බර් 01 දින අවලංගු කර නැවත නිකුත් කිරීම හේතුවෙන් විනිමය අනුපාතයන්ගේ බලපෑම නිසා රු.10,712 ක ගාස්තුවක් බැංකුව විසින් අයකර ඇති අතර එම මුදල ආයතනයට සිදුවූ පාඩුවක් ලෙස විගණනයට නිරීක්ෂණය විය.

(ඇ) පවිත්‍රතා කටයුතු සේවා කොන්ත්‍රාත්තුව සඳහා 2013 වර්ෂයේදී රාජ්‍ය සංස්ථාවකට අනුබද්ධිත පුද්ගලික සමාගමක් සමඟ 2014 වර්ෂයේදී ද එළඹි ගිවිසුමෙහි කොන්ත්‍රාත් මිලට වඩා මාසයකට රු.58,650 ක් වැඩියෙන් ගිවිස ගැනීම නිසා ආයතනයට සිදු වූ පාඩුව රු.703,800 ක් විය.

**4.6** **වාහන උපයෝජනය**

----------------------

ආයතනය සතු වාහන 2 ක් විධිමත් අනුමැතියකින් තොරව අමාත්‍යවරයාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට ලබාදී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී කිලෝමීටර් 16,547 ක් ධාවනය කර තිබුණි. ඒ අනුව බස් රථ කුළී ආදායම රු.876,230 ක් අයවිය යුතු වුවද එය අයකර ගැනීමට හෝ ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

**5.** **ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

----------------------------------------

**5.1** **අභ්‍යන්තර විගණනය**

------------------------

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009/(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කළ යුතු වුවද එසේ කර නොතිබුණු හෙයින් අභ්‍යන්තර විගණන කටයුතු කිසිවක් සිදුකර නොතිබුණි. එසේම අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය හරහා විගණන කටයුතු සිදු කිරීම කෙරෙහිද අවධානය යොමුවී නොතිබුණි.

**5.2** **නොවිසඳී ඇති විගණන ඡේද**

------------------------------

පසුගිය විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති නමුත්, ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු විගණන ඡේද පහත දැක්වේ.

| 2013 වර්ෂයේ විගණන ඡේදයට යොමුව | විගණන ඡේදයේ සාරාංශය |
|---|---|
| (අ) 4.1 (අ) | 2001 අංක 1 දරන ජාතික සමුපකාර සංවර්ධන ආයතනය (සංස්ථාපනය කිරීමේ) පනතේ 4 වගන්තිය පරිදි ආයතනය සංස්ථාගත කිරීමෙන් සාක්ෂාත් කරගැනීමට අපේක්ෂිත වූ ප්‍රධාන කාර්යයන් ඉටු කර නොතිබුණි. |
| (ආ)4.3 (ආ) (iii) මෙහෙයුම් අකාර්යක්ෂමතා | පවිත්‍රතා සේවා සැපයීම් ගිවිසුමේ කොන්දේසි පරිදි, උප කොන්ත්‍රාත්තු ප්‍රදානය කිරීම කළ නොහැකි වුවද, ඊට පටහැනිව කොන්ත්‍රාත්තුව ලබාගත් පුද්ගලික සමාගම විසින් වෙනත් පුද්ගලික ආයතනයකට උප කොන්ත්‍රාත් ලබා දී තිබුණ අතර මේ සම්බන්ධයෙන් ආයතනය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |

**6.** **පද්ධති හා පාලනයන්**

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

(අ) ගිණුම්කරණය
(ආ) මූල්‍ය පාලනය
(ඇ) වත්කම් පාලනය
(ඈ) කොන්ත්‍රාත්තු පරිපාලනය
(ඉ) මානව සම්පත් කළමනාකරණය